## පැළ තුනී කිරීම

සිටුවා සති 3 දී 6 දී පමණ එක ස්ථානයක එක පැළයක් සිටින සේ පැළ ගලවා ඉවත් කළ යුතුය.

## වල් මර්ධනය

සිටුවා සති 3 දී 6 දී වල් මර්ධනය කළ යුතුයි.

## ජල සම්පාදනය

පළමු සති 3 තුළ දී දින 4 කට වරක් හා පසුව දින 7 කට වරක් ජල සම්පාදනය කල යුතුයි. මල් පිපෙන හා කරල් පිරෙන අවස්ථාවේ දී ජල සම්පාදනය ඉතා වැදගත් වේ. කෙසේ වෙතත් පසේ පවතින තෙතමනය අනුව ජලය සැපයිය යුතු අවස්ථාව තීරණය කළ යුතුය.

## අස්වනු නෙලීම

පිදුරු පැහැ වූ කරල් වාර කිහිපයකදී නෙලා ගත යුතුය. නෙලාගත් කරල් අව්වේ වියලා ගෝනිවල දමා ලීයකින් තැලීමෙන් බීජ වෙන්කර ගත හැක.

## ගබඩා කිරීම

කරල්වලින් වෙන්කරගත් බීජ පිරිසිදු කර අව්වේ හොඳින් වියලා ගත යුතුය. ගබඩා කර ඇති විටදී රනිල ගුල්ලාගේ හානියට ගොදුරු විය හැකි නිසා වරින් වර බීජ වියලීම කල හැක.

## මැද කන්නයේ වගා කිරීම

මහ කන්නයේ අස්වනු නෙලා ගත් පසුව නැවත යල කන්නයේ වී වගාව ආරම්භ කරන තෙක් මාස 2 - 3 ක පමණ කාලයක් කුඹුරු පුරන්ව පවතී. මෙම කාලසීමාව මැද කන්නය ලෙස හැඳින්වේ. වියළි කලාපයේ බොහෝ ප්‍රදේශවල මහ කන්නයේ අස්වනු නෙලීම පෙබරවාරි මස දී ආරම්භ වන අතර නැවත යල කන්නය සඳහා වගා කරන්නේ අප්‍රේල් මස අග දී පමණය.

කුඹුරුවල ශේෂ වී ඇති තෙතමනය සහ, මෙම කාලය තුළ දී බලාපොරොත්තු විය හැකි අතරින් පතර ලැබෙන වැසි උපයෝගී කර ගනිමින් කෙටි කාලීන රනිල භෝගයක් කුඹුරුවල සතුටුදායකව වගා කළ හැකි බව පෙනී ගොස් තිබේ. මෙම භෝගයේ නඩත්තුව සඳහා වැඩි මහන්සියක් දැරීම අවශ්‍ය නැත. එහි අස්වැන්න වැඩි මුදලකට ඉතා පහසුවෙන් අලෙවි කර ගත හැකිය. මෙම වගාව සඳහා තෝරා ගත යුත්තේ හොඳින් හෝ මධ්‍යස්ථ ලෙස ජලය බැසයන කුඹුරු පමණි. කාන්දු වීම මඟින් ජලය ලැබෙන කුඹුරු ද යෝග්‍ය වේ.

දින 50 - 70 කදී පමණ කාලයක දී අස්වනු ලබා ගත හැකි කෙටි කාලීන රනිල භෝග වර්ග මැද කන්නයේ වගාව සඳහා වඩා සුදුසුය.

වැඩි විස්තර සඳහා
අධ්‍යක්ෂ,
ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය,
මහඉලුප්පල්ලම.

දුරකථන/ෆැක්ස්:- 025-2249177/025-2249132

ඊ-මේල්:- fmrc@sltnet.lk

Designed by AUDIO VISUAL CENTRE, Department of Agriculture, Peradeniya.
Printed by AGRICULTURE PRESS, Gannoruwa.

අපි වවමු - රට නඟමු

දේශීය ආහාර නිෂ්පාදනය
දිරි ගැන්වීමේ
ජාතික මෙහෙයුම 2007-2010

# කව්පි වගාව



කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.

# වගා කරන ආකාරය

## නියමිත කාලයට වගා කිරීම

වර්ෂා ජලයෙන් මහ කන්නයේ වගා කරන විට නොවැම්බර් මැදදී ද යල කන්නයේ දී අප්‍රේල් මස ලැබෙන පළමු වැස්සත් සමගම දා වගාව ආරම්භ කිරීම සුදුසුයි. අස්වනු නෙළන අවධියේදී වියළි කාලගුණ තත්වයක් තිබිය යුතුය.

## සුදුසු බිමක් තෝරාගැනීම

ජල වහනය හොඳින් සිදුවන බිමක් තෝරාගත යුතුය. පෙර කන්නයේ රනිල භෝග වගා නොකරන ලද බිමක් නම් වඩාත් සුදුසුය.

## බිම් සැකසීම

15 - 20 cm පමණ ගැඹුරට පස පෙරලා කැට පොඩිකර ගත යුතුය. සමතලා භූමියේ හෝ වැටි හා කාණු ක්‍රමයට බීජ සිටුවිය හැක.

පොහොර යෙදීම - කි.ග්‍රෑ./හෙ.

| | | |
|---|---|---|
| මූලික පොහොර | බීජ සිටුවීමට පෙර | |
| යූරියා | 35 | |
| ට්‍රිපල් සුපර් පොස්පේට් | 100 | |
| මියුරේට් ඔෆ් පොටෑෂ් | 75 | |
| මතුපිට පොහොර | | |
| යූරියා | 30 | මල් පිපෙන අවධියේදී |

## බීජ සිටුවීම

පේලි අතර පරතරය 30 cm හා පැළ අතර පරතරය 15 cm සිටින සේ බීජ සිටුවීම කල යුතුය. බීජ අවශ්‍යතාවය 35 - 40 කි.ග්‍රෑ./හෙ. පමණ වේ.

## බීජ ප්‍රතිකාර කිරීම

සුදුසු දිලීරනාශකයකින් ග්‍රෑම් 4 ක් බීජ කිලෝග්‍රෑම් 1 කට යෙදීම මඟින් බෝගය දිලීර රෝගවලින් ආරක්‍ෂා කරගත හැක.

## නිර්දේශිත ප්‍රභේද

| ප්‍රභේදය | වයස (දින) | පුෂ්පය | බීජ | අස්වැන්න kg/ha |
|---|---|---|---|---|
| බොම්බේ | 75-90 | දම් | කැලලේ සහිත ඇළු දුඹුරු | 1400 |
| MI 35 | 60-70 | සුදු | ක්‍රීම්/සුදු | 1500 |
| විජය | 60-70 | දම් | ලා දුඹුරු | 1500 |
| වරුණි | 60-70 | දම් | රතු දුඹුරු | 1600 |
| ධවල | 60-70 | සුදු | සුදු | 1500 |

බොම්බේ



එම්.අයි. 35



විජය



වරුණි



ධවල

